# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2021

2024 සැප්තැම්බර්

මානවශාස්ත්‍ර පීඨය

සිංහල (පැරණි නිර්දේශය)

**භාෂා පරිණාමය, පුරාක්ෂර විද්‍යාව හා කලාශිල්ප SINH – E3025**

පළමුවන ප්‍රශ්නය ද දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

## 1 කොටස

01. පහත සඳහන් ශිලා ලේඛන පාඨයන්හි අදහස ලිහිල් බසින් ලියන්න.

අ) කණගම - ර[ඣධශ] තිශහ ඣිත ශවෙර - ශමණිය ලෙණෙ ශගශ

පරුමක - නමලි - ශුමන - පුතහ - පරුමක - යශොපලහ ලෙණෙ ශගශ

පරුමක - ගුත - පුත පරුමක ශුමනහ ලෙණෙ අගත - අනගත
[ච] තු- දි [ශ]- ශගශ

පරුමක - වෙශමණ - පුත - බරණිය ලෙණෙ දෙවහ ච
චතු - දිශ - ශගශ

පුශගු [ත-තෙරහ අතෙවශික] බරත - තිශහ ලෙණෙ ශගශ

(ලකුණු 10 යි)

ආ) ගම්ලද්දන් ගැත්ත-
-න් මඤඩින් හිඤ වි
-තාර කොට පිරිකපා
ත(බා) දුන් දඩ ගනුත්
මිසැ ගම වටා ගෙනැ
ගෙ තිරැ ගෙනැ දඩ
නො එළ්වනු ඉසා (1*)
දඩ ගැමැ-හිඤ එ (ළ්)-
-වත් මිසැ කුඩින්
ගැමින් පිටත් කොට
නො ගෙනැ යනු ඉසා (1*)
නොපිරිකැපූ දඩට
වැලැක්මෙ නො ගන්-
-නා කොට ඉසා (1*) ලී
දඩට ස්වාමී ගිනු-

-ත් මිසැ අබුදරු
-වන් වැලැක්මෙ නො
ගන්නා ඉසා (1*) ගම-
-ට් ආ රදොලන් රහ
මස් දිහි තෙල් නො
ගන්නා ඉසා (1*) වතු-
පෙත් වෙත් වැදූ රහ
නොගන්නා ඉසා (1*)
සොරවෙළඳම් නො
කරනු ඉසා (ලකුණු 10 යි)

ඇ) සෙය් ගිරි වෙහෙර්හි ඉසා බද් තුවාක් ඇත් වෙහෙර
ගම්බිමට් ඉසා මෙහි මෙ අබැදි තුවක් වෙහෙර්හි ඉසා

රජ්මහවෙහෙර්හි ඉසා පිරිවෙන්හි ඉසා පියන්ගල්හි ඉසා
මෙහෙණිවර්හි ඉසා සඟ් සතු පුගුල් සතු ලාභ

යෙහි ඉසා බජ් තුවාක් ගම්බිමට් රජ්කොල් කැමියන් වැදූ
වැරියන් ගැල් ගොන් මීවුන් නොගන්නා ඉසා ගස්කො-

ළ් නොකපනු ඉසා මෙලාට්සී නොවද්නා ඉසා මිනී කෙටූ
කෙනෙකුන් ඇත ගමට් වැදූ ඔවුන් මැ ඉල්ලත්මුත් සෙසු-

එහි නොපහළ් සෙසු කුඩීනට් අනියා නොකරනු ඉසා දෙදෙ
හවුරුද්දෙන් ගොස් රජ්කොල් සම්දරුවන් රට් ඉල්ලා

(පස්) මහා සාවද්දූ වරජ් ඉල්ලත්මුත් සෙසු වරද් නො ඉල්ලනු
ඉසා පෙරෙ කැමියන් ගම් දන්නාසෙ දඬ් ගෙනැ

පැට්වූ වරදට් වටාලා දඬ් නොගන්නා ඉසා ඇත්වෙහෙර
ගම්බිමින් ගත් හැමැ දඬ් ඇත්වෙහෙර කම් න

වාමට් දෙනු ඉසා පෙරෙ නොවන් විරි තැනට් පෙරෙ නාට්ටියම්
නොවද්නා ඉසා රට් පටවන්නට් ගිය රජ්කොල්

සම්දරුවන් ගත් දඬැ ගිඟිරියක් ඇත සම්දරුවන් දඬ නායකයන්
හින්දූ විචාරකොට් හැරියැ යුතුවක්

හර්නා ඉසා මිනී කොටා සඟුන්වන් තැනට් වන් කෙනෙකුන්
ඇත එහි පහළ වනුද් ඔව්නුජ් විචාරකොට් දම්බ්

දිව් යවන්නට් හර්නා ඉසා (ලකුණු 10 යි)

ඈ) වූ දඬ් සිහින් දඬ් පෙරෙ සිරිත්සෙ ගම්ලද්දන් පමුණු
(ලද්දන් බෙදා) ගන්නා කොට් ඉසා මීවුන් ගෙරිගොන් එළු
වන් මැරුවන් මරා පට්වනු කොට් ඉසා නොමරා සොරා
ගෙනැ ගිය නියත කොට් ඔවුන් ඔවුන් කසිලැ සත්ල
කුණ් ඔබා හර්නා කොට් ඉසා තිර නො වත් කොටා පට්ව
නු කොට් ඉසා බැහැරින් ඇර විකුණන මීවුන් ගෙරි
ගොන් එළුවන් හැන්දිනැ ඇපැ ගෙනැ ගන්නා කොට් ඉසා
අණ මැකුවන් රත්කළ යමර වැඩි(෧)ය සිට්වනු කො

ට් ඉසා මෙ දස ගැ(මැ කුඩීන්) තමන් තමන් කුලෙහි (වැ
ටෙ)න මඟුලවමඟුල වලන්ද්නා පැරහැර නො ඉක්මැ
වැටෙනු කොට් ඉසා මෙ දසගමට් (වැවස්ථා) කළ තැනි
න් (එකෙක) අවුද් (වුන්) කු(ඩී) කෙනෙකුන් ඇත හැන්දිනැ ඇ
(පැ) ගෙනැ හින්ද්වනු කොට් ඉසා නො යෙදෙන්නක් කොට්
වන් කෙනෙකුන් ඇත ඇපැ ගතදූ පළමුවූ ගැමැ ඇ(ත්ත
න්) පට්වන්නට් හර්නා කොට් ඉසා (ලකුණු 10 යි)

<u>නැතහොත්</u>

පහත සඳහන් ශිලා ලිපි කියවා වර්තමාන සිංහල අකුරෙන් ලියන්න.



(ලකුණු 10 යි)

## II කොටස

02. ලංකාවේ බ්‍රාහ්මී අක්ෂර මාලාව අශෝක බ්‍රාහ්මී අක්ෂර මාලාවෙන් වෙනස් වන ආකාරය පහදන්න.

03. සිංහල භාෂාධ්‍යයනයේ දී සෙල්ලිපි, මූලාශ්‍රය වශයෙන් වැදගත් වන ආකාරය නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න.

04. දහවන සියවසේ ලංකාවේ භාවිත වාණිජ නීතිය පිළිබඳ කිනම් තොරතුරු බදුලු ටැම් ලිපියෙන් ප්‍රකට වේ දැ' යි පහදන්න.

05. ''පස්වන කාශ්‍යප රජුගේ අනුරාධපුර පුවරු ලිපිය ආරාම පරිපාලන පිළිබඳ ව්‍යවස්ථාවකි.'' විමසන්න.

## III කොටස

06. ශ්‍රී ලංකාවේ ශිල්පකලා කෙරෙහි භාරතීය බලපෑම් සිදුවූ ආකාරය පිළිබඳ විමසීමක් කරන්න.

07. භාරතීය ස්තූපයේ ආභාසය කෙරෙහි විශේෂාවධානයක් යොමු කරමින් ශ්‍රී ලාංකේය ස්තූපයේ නිර්මාණාත්මක ලක්ෂණ පිළිබඳ හැඳින්වීමක් කරන්න.

08. ශ්‍රී ලාංකේය බුද්ධ ප්‍රතිමාවේ ප්‍රභවය හා විකාසනය පිළිබඳ සමාලෝචනයක් කරන්න.

09. ශිල්පීය ලක්ෂණ කෙරෙහි මූලිකාවධානයක් යොමු කරමින් සීගිරි චිත්‍ර පිළිබඳ ඇගයීමක් කරන්න.

නැතහොත්

මහනුවර සිතුවම් කලාව පිළිබඳ හැඳින්වීමක් කොට, ආගමික සන්නිවේදනය සඳහා එමගින් ලද අනුබලය සනිදර්ශනව විභාග කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතරෙන් <u>දෙකකට</u> සටහන් සපයන්න.

i. ශ්‍රී ලංකාවේ ප්‍රාග් - බෞද්ධ කලා
ii. පොළොන්නරු යුගයේ හින්දු ප්‍රතිමා
iii. ඉසුරුමුණි කැටයම්
iv. දඹුලු ලෙන් විහාරය
v. බෝධිඝර

(02 - 10 දක්වා සෑම පිළිතුරකට ම ලකුණු 15 බැගින්)

*********************************